# ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය



අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව පිළිමය - අනුරාධපුර යුගය (8-9 සියවස)
ජාතික කෞතුකාගාරය

ECONOMIC HISTORY MUSEUM of Sri Lanka

අවලෝකිතේශ්වර ප්‍රතිමා දිවයින පුරා බොහෝ ස්ථානවලින් හමු ව තිබේ. අවලෝකිතේශ්වර වන්දනාව මහායාන සම්ප්‍රදායයට අයත් වුවත් බැවින් ඒ ප්‍රතිමා මෙතරම් සුලබ ලෙස මෙරට දක්නට ඇත්තේ මන්දැයි පැනයක් පැන නගී.

නොඅනුමානයෙන් නැගෙන මේ පැනය විසඳෙන්නේ නැව් බිඳුම් වලදී නැවියන්ගේ පිහිටට එන ආරක්ෂක දේවතාවකු වශයෙන් අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් පිදුමට ලක් වූ බව දැන ගැනීමෙනි.

සමුදුරු සරන වෙළඳ යාත්‍රිකයන්ගේ නිරන්තර ගමනාන්තයක් ව සියවස් ගණනාවක් පුරා පැවැති ශ්‍රී ලංකාව ඒ වෙළඳ සබඳතා තුළින් ලද ධනයෙන්, දැනුමෙන්, සංස්කෘතිකාංගයන්ගෙන්, සම්ප්‍රදායයන්ගෙන් මෙන්ම අවලෝකිතේශ්වර වන්දනාව බඳු වූ නොයෙක් ආගමික ඇදහිල්ලෙන් ද සරු විය.

මෙසේ ලද පෝෂණයෙන් පිටුබලය ලත් අපේ ආර්ථිකය වඩා ශක්තිමත්ව ලෝකය ඉදිරියේ පෙනී සිටි බව ටොලමි සිය ලෝක සිතියමෙහි ශ්‍රී ලංකාව එහි සැබෑ පරිමාණයට වඩා විශාලකොට දැක්වීමෙන් පෙනී යයි.

## ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය

ශ්‍රී ලංකාවෙහි එම ආර්ථික ඉතිහාසය පිළිබඳ සම්පූර්ණ කතා පුවත එකම වහලක් යටට ගෙන එන්නට අප දරන ප්‍රයත්නයයි.

කොළඹ කොටුවේ චැතැම් වීදියෙහි "සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලෙහි" දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් අතින් 2013 නොවැම්බර් 11 වැනි දින විවෘත වූ "පුරාණයෙන් රුපියලට" ප්‍රදර්ශනය ඒ කෞතුකාගාරයේ පළමු පියවර වූ අතර, එය අංග සම්පූර්ණ කෞතුකාගාරයක් බවට පත් කිරීමේ දෙවැනි පියවරට මහ බැංකුවේ අපි දැන් පිය නගන්නෙමු.

**ජාතික වැදගත්කමකින් යුක්ත මේ මහඟු කාර්යයට උර දීමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.**

- **මේ ව්‍යාපෘතියට වැදගත් විය හැකියයි සිතන යම් තොරතුරක් ඔබ සතු නම්,**
- **කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනයට තැබිය හැකි යම් භාණ්ඩයක් එනම්, ඓතිහාසික වැදගත් කමකින් යුත් කාසියක්, නෝට්ටුවක්, පොතක්, පුස්කොළයක් හෝ සෙල්ලිපියක්, වෙනත් ලියැවිල්ලක්, ඡායාරූපයක්, උපකරණයක්, වෙළෙඳ භාණ්ඩයක්, ඇඳුමක්, ඔබ සතු නම්, නැතහොත් එවැන්නක් ඇති ස්ථානයක් ඔබ දන්නේ නම්,**
- **ඔබ මෙම ව්‍යාපෘතියට ස්වේච්ඡාවෙන් දායක වීමට කැමැති ඉතිහාසඥයෙක්, පුරාවිද්‍යාඥයෙක්, චිත්‍ර ශිල්පියෙක්, සැලසුම් ශිල්පියෙක්, හෝ වෙනත් එවැනි ආශ්‍රිත විෂයයක දැනුමැත්තෙක් නම්,**

**අද ම අප අමතන්න. නැත්නම් අපට ලියන්න. ඔබ විසින් කළ හැකි උපකාරය අපට කියන්න. මවු බිම වෙනුවෙන් වගකීමක් ඇති ඔබ වැනි පුරවැසියන්ගෙන් මේ සත්කාර්යයට ලැබෙන දායකත්වය අපි මහත් සේ අගය කරන්නෙමු.**


**කතා කරන්න**

**භාග්‍යා 0112 477669 / කිරුති 0112 477198**

**econhistory@cbsl.lk**

අධ්‍යක්ෂ
සංනිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01.